# ලෝරන්ස්, ක්වොන්ටම් භෞතිකය හා පශ්චාත්නූතනවාදය

පළමුවැනි එලිසබෙත් රැජිනගේ කාලයෙහි සුචරිතවාදීයා හෙවත් පියුරිටන් යන්නෙන් හඳුන්වනු ලැබුවෝ ප්‍රොතෙස්තන්ත ආගම හා සංස්කෘතිය නිසි ලෙස වර්ධනය නොවී යැයි ද පිළිගැනීමට ලක්නොවී යැයි ද යැයි සිතූ අය වූහ. ඔවුන්ට අනුව එදා සමාජයේ පිළිගැනීමට ලක්වූයේ කතෝලික සංස්කෘතිය හා කතෝලික ආගමික ආකල්ප ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ඒ පිළිගැනීම නැතිකර ප්‍රොතෙස්තන්ත ආගමට නිසි පිළිගැනීමක් ලබාදීම ය. එසේ කිරීම දියුණු කිරීමක් ලෙස සැලකිණි. දියුණුව යන්න බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හා බැඳී තිබුණු බැවින් හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආගම් වූයේ ප්‍රොතෙස්තන්ත ආගම් බැවින් ඒ ප්‍රවනතාව එසේ ම විය යුතුව තිබුණි.

එහෙත් වික්ටෝරියානු රැජිනගේ කාලය වන විට ඒ කනපිට පෙරලී තිබුණි. ඒ වන විට එංගලන්තයේ සංස්කෘතිය ප්‍රොතෙස්තන්තවාදීන්ට අවශ්‍ය අන්දමට වර්ධනය නොවූවා පමණක් නොව එසේ වර්ධනය කිරීමට තැත්කිරීම ද වරදක් ලෙස සැලකිණි. එවිට සුචරිතවාදීයා ලෙස හඳුන්වනු ලැබුවෝ එසේ වර්ධනයකිරීමට විරුද්ධ වූවෝ වූහ. එහෙත් මෙහි සුචරිතවාදියා යන්න යෙදුණේ එක්තරා ආකාරයකින් ගත්කල නින්දාකාරී අර්ථයකිනි. සුචරිතවාදියා යන්නෙන් ගර්හාවට ලක්වූ පුද්ගලයකු හැඳින්විණි. සුචරිතවාදියා දැන් සමාජයට ඉදිරියට යෑමට ඉඩ නොදෙන්නෙක් විය.

සුචරිතවාදියා හෙවත් පියුරිටන් යන වචනයේ විකාශයෙන් කියැවෙන්නේ ද එංගලන්ත සමාජය විකාශය වී තිබූ ආකාරය ය. පළමුවැනි එලිසබෙත් රැජිනගේ කාලයේ දී එය ගර්හිත ආකාරයකින් යොදා නො ගැණිනි. ඒ වචනයෙන් ඉදිරිගමනක් සංකේතවත් විය. එහෙත් වික්ටෝරියා රැජිනගේ කාලය වන විට ඒ වෙනස් වී තිබුණි. ඒ වචනය යෙදුණේ සමාජයේ ඉදිරි ගමනක් බලාපොරොත්තු නොවූවන් සම්බන්ධයෙනි. එහෙත් එලෙස ඉදිරි ගමනකට විරෝධය පෑම සුචරිතවාදයක් විය. එයට හේතුව වූයේ එංගලන්ත සමාජය වික්ටෝරියානු සමය වන විට සමාජයෙහි  සුචරිතය කුමක් දැයි නිසි ලෙස සූත්‍රගතකර (formulate) නො තිබීම ය.

වෙනත් වචනවලින් කිවහොත් වික්ටෝරියානු සමාජයට, එනම් එකල තිබූ සමාජයට, අදාළ සදාචාර සංග්‍රහය කුමක් ද යන්න පිළිබඳ ව ඒ සමාජයට නිසි අවබෝධයක් නො තිබිණි. ප්‍රසිද්ධියේ සම්මුතිය වූයේ සමස්තයක් ලෙස ඉන්ද්‍රිය පිනවීමට එරෙහි වූ යම් කතෝලික සදාචාරයකි. එහෙත් ඉන්ද්‍රිය පිනවීමට එරෙහි වූ කතෝලික තහංචිවලට විරුද්ධව යන, පෞද්ගලිකත්වය ඉස්මතු කරන සංස්කෘතියක් ද තැන තැන දක්නට ලැබිණි. එලෙස තැන තැන සම්මුතියට එරෙහිව, එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අදාළව පැන නැගුණු සදාචාරය සම්මුතිය බවට පත්කර ගැනීමේ අවශ්‍යතාව සමාජයට විය.

ඩී. එච්. ලෝරන්ස් මහතා වැන්නන්ට සිදුවූයේ මේ අවශ්‍යතාව මුදුන්පත් කරගැනීම සඳහා බුද්ධිමය නායකත්වය සැපයීම ය. ඔවුහු එයට නිර්භය ව මුහුණ දුන්හ. අද වන විට එංගලන්තය වික්ටෝරියානු සදාචාරය වෙනුවට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සදාචාරය පිළිගෙන ඇත. පෞද්ගලිකත්වය හා ඉන්ද්‍රිය පිනවීම කෙතරම් වර්ධනය වී ඇත් ද යතහොත් අද දරුවන් බිහිකිරීම තවදුරටත් විවාහයෙහි හා ලිංගික ක්‍රියාකාරකමවලි ප්‍රධාන කාර්යයක් ලෙස නො සැලකෙයි. ඇංග්ලිකන් සංස්කෘතියෙහි සම ලිංගික විවාහවලට ද අවසර ලැබී ඇත. මේ විසිවැනි සියවසෙහි මුල්භාගයෙහි තිබූ තත්වයට වඩා ඉතා වෙනස් බව අවබෝධ කරගැනීමේ අපහසුවක් නැත.

එලෙස ගත්කල ලෝරන්ස් මහතා වැන්නවුන්ගේ ව්‍යායාමය සාර්ථක වී ඇත. එහෙත් ඔවුනට ඒ සාර්ථකත්වය අත්වූයේ ඔවුන්ගේ දක්ෂතාවකට වඩා ඔවුන්ගේ සේවය සමාජයට අවශ්‍ය වී තිබූ බැවිනි. ඒ සේවය සමාජයට එසේ අවශ්‍ය නොවන්නට අද ඩී. එච්. ලෝරන්ස් මහතා ගැන කතාකරන්නකු නැතිවන්නට තිබුණි. ලෝරන්ස් මහතා සාහිත්‍යකරුවෙක් විය. ඔහු සමාජයීය විද්‍යාඥයෙක් නො වී ය. එබැවින් ඔහුට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය (බටහිරයන් කියන ආකාාරයට නම් නූතනත්වය) ගැන ප්‍රවාද නිර්මාණය කිරීමේ අවශ්‍යතාවක් නො වී ය.

© Prof. Nalin De Silva

වර්තමානයේ ජීවත්වන ඊනියා පශ්චාත්නූතනවාදී සාහිත්‍යකරුවන් යැයි කියන්නන් පශ්චාත්නූතනවාදී සාහිත්‍යයක් ගැන කතාකරන ආකාරයට ලෝරන්ස් මහතාට නූතනත්වවාදී සාහිත්‍යයක් ගැන කතාකිරීමේ අවශ්‍යතාවක් නො වී ය. නූතනත්වවාදී සාහිත්‍යයේ අංගයක් ලෙස ලෝරන්ස් මහතාගේ කෘති එංගලන්තයේ බිහිවූයේ සමාජ විකාශයක් සමගින් ය. ලෝරන්ස් මහතාගේ සාහිත්‍ය නිර්මාණය එංගලන්ත සමාජයේ විකාශයේ ඓන්ද්‍රිය අංගයක් විය. ඒ සාහිත්‍යයට පැරණි සාහිත්‍යය සමග යම් ගැටුමක් විය. එසේ වූයේ සදාචාරය සම්බන්ධ ප්‍රශ්නවල දී ය. එහෙත් යථාර්ථවාදය සම්බන්ධයෙන් ලෝරන්ස් මහතාට එතෙක් තිබූ සාහිත්‍යය සම්බන්ධයෙන් ගැටුමක් නො වී ය.

පශ්චාත්නූතනවාදී යැයි කියන සාහිත්‍යය බටහිර බිහිවූයේ එතෙක් තිබූ සාහිත්‍යය සමග යම් ආකාරයක සමාජයීය ගැටුමකින් පසුව නො වෙයි. ඊනියා පශ්චාත්නූතනවාදී සාහිත්‍යය යනු නූතනත්වයෙහි ම අංශභාග කොටසක් ලෙස වර්ධනය වුවක් වෙයි. ලෝරන්ස්වාදී සාහිත්‍යය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම වර්ධනයක් වුවත් ඊනියා පශ්චාත්නූතනවාදී සාහිත්‍යය බටහිර වර්ධනය වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නිව්ටෝනීය සුසමාදර්ශයට පටහැණි ව ය. එබැවින් ඒ සාහිත්‍යය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි තහවුරු කරගැනීම ප්‍රශ්නයක් වෙයි.

නිව්ටෝනීය සුසමාදර්ශයට පටහැණිව යන ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි ද මේ තත්වය දැකගැනීමට ඇත. ක්වොන්ටම් භෞතිකය නිව්ටෝනීය සුසමාදර්ශයට පටහැණි වෙයි. එහෙත් ක්වොන්ටම් භෞතිකය නිර්මාණය වන්නේ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ය. මේ අංශභාග වර්ධනයක් වෙයි. මෙහි දී බටහිර භෞතික විද්‍යාඥයන්ට මාවත් දෙකක් විවෘත වෙයි. එක්කෝ ඔවුන් ක්වොන්ටම් භෞතිකය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි තහවුරු කරගත යුතු ය. නැත්නම් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පටහැණි චින්තනයක් නිර්මාණය කර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට වෙනස් සමාජයක් සඳහා අත්තිවාරම දැමිය යුතු ය.

මෙහි දී බටහිර භෞතික විද්‍යාඥයන් ගන්නේ පළමු මාවත ය. ඔවුහු ක්වොන්ටම් භෞතිකය බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි තහවුරු කරගැනීමට උත්සාහ දරති. ඔවුන්ගෙන් එයට වැඩි දෙයක් බලාපොරොත්තු නොවිය හැකි ය. බටහිර නව සමාජයක් බිහිවීම තව කල්ගත වී කෙරෙන්නකි. කිනම් ප්‍රශ්න තිබුණ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අද හෙට කඩා නො වැටෙයි. එබැවින් බටහිර භෞතික විද්‍යාඥයන් ක්වොන්ටම් භෞතිකය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම තහවුරු කරගැනීමට වෑයම් කිරීම පුදුමයක් නො වෙයි.

ඊනියා පශ්චාත්නූතනත්වය ද එවැන්නකි. අද බටහිර සමාජය වෙනුවට වෙනත් ම සමාජයක් අවශ්‍ය වී ඇත. පරිසරවාදීන් කෙතෙක් කෑමොර ගැසුව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පරිසරය රැකිය නො හැකි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා පරිසරය යනු එකිනෙක සමග ගැටෙන ප්‍රපංච වෙයි. පරිසරය රකිමින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇතිකර ගතහැකි ඊනියා සංවර්ධනයක් නැත. බටහිර ආකාරයේ සංවර්ධනයක් සඳහා ස්වාභාවික සම්පත් වැඩි වැඩියෙන් නැති කර ගත යුතු ය.

එහෙත් එපමණකින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය කඩා නො වැටෙයි. බටහිර රටවල් මෙන් ම භූගෝලීය වශයෙන් බටහිර නොවන ඉන්දියාව හා චීනය වැනි රටවල් ද පරිසරය විනාශ කරමින් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව දියුණුව තව තවත් හඹායනු අපට දැකිය හැකි වනු ඇත. එහෙත් ඒ අතර අතීසාරයට අමුඩ ගසන්නාක් මෙන් පරිසරය රැකීම සඳහා ද මේ රටවල් සියල්ල යම් යම් පියවර ගනු ඇත. ඉන් රැකෙන පරිසරයක් නැති බව තේරුම් ගැනීමට බොහෝ දෙනාට සෑහෙන කාලයක් ගතවනු ඇත.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අවසානයේ දී කඩා වැටෙනු ඇත්තේ පෞද්ගලිකත්වය වැඩීමට යෑම ඔස්සේ ය. පුද්ගලයා අනෙක් පුද්ගලයන්ගෙන් පමණක් නොව සමාජයීය වශයෙන් ගත්කල තමන්ගෙන් ද වෙන්වන දිනයක් වෙයි. එදින ඒ මානසික්වය සමාජයීය භින්නෝන්මාදයක් වනු ඇත. තදුරටත් එවැනි සමාජයක් පවත්වාගෙන යෑම අපහසු වනු ඇත. එහි ප්‍රතිඵලය වනුයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය කඩා වැටීම ය. එහෙත් එයට පළමු මිනිසුන් ඒ සමාජය කඩා වැටීම වටහාගෙන වෙනත් සමාජයක් ඇතිකර ගැනීමේ දිශාවට හමන් කිරීමට ද ඉඩක් වෙයි. ඒ ගැන කල්තබා අනාවැකි පළකිරීමක් කළහැකි යැයි නො සිතමි.

© Prof. Nalin De Silva

සමාජයීය භින්නෝන්මාදය ඇතිවීමට කල් තිබුණ ද අද වන විට බටහිර සමාජයෙහි මුල් බැසගෙන ඇති යථාර්ථය යන්න කැඩී බිඳී යනු දැකිය හැකි ය. අඩුම තරමින් ක්වොන්ටම් භෞතිකයෙහි ස්ථානීය යථාර්ථය (local reality) යන්න බිඳ වැටී ඇති බව දැන් පර්යේෂණාත්මක ව පෙන්විය හැකි වෙයි. ස්ථානීය යථාර්ථය හා පොදුවේ යථාර්ථය වෙනුවෙන් පෙනී සිටි අය අතර අයින්ස්ටයින් පඬිවරයා ද විය. අයින්ස්ටයින් විද්වතා ඒ වෙනුවෙන් පර්යේෂණයක් ද යෝජනා කෙළේ ය. ඒ පර්යේෂණයට සමාන වූවක් ඇස්පෙ නම් විද්‍යාඥයා විසින් අවුරුදු විසිපහකට පෙර 1982 තරම් කාලයක දී කරනු ලැබිණි. මේ පර්යේෂණය දැන් ඉතා සියුම් හා විදග්ධ අයුරින් සිදු කළ හැකි ය. ඒ පර්යේෂණ සියල්ලෙන් පෙන්නුම් කෙරෙන්නේ ස්ථානීය යථාර්ථයක් නැති බව ය.

මේ ස්ථානීය යථාර්ථය බිඳ වැටීම ගැන මෙරට යථාර්ථවාදී පුස්සන් නොදැන සිටීම පුදුමයක් නො වෙයි. බටහිර ඇතැම් යථාර්ථවාදීහු ඒ බව දැන සිටිය ද ඒ පිළිගැනීමට අකමැති වෙති. එබැවින් ඔවුහු ක්වොන්ටම් භෞතිකයට විවිධ අර්ථකථන දෙති. ඒ යථාර්ථය යන්න බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට නැතිව ම බැරි සංකල්පයක් වීම හේතුවෙනි. එබැවින් ඔවුහු යථාර්ථය රැකගනු වස් ක්වොන්ටම් භෞතිකය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම රඳවාගැනීමට වෙර දරති.

ඊනියා පශ්චාත්නූතනවාදීන් අතින් සිදුවන්නේ ද එබඳුම දෙයකි. ලෝකය ඊනියා යථාර්ථවාදයක සිරවී තේරුම්ගත නොහැකි බව ඊනියා පශ්වාත්නූතනවාදී සාහිත්‍යයෙහි කියැවෙයි. එහෙත් ඊනියා යථාර්ථවාදීහු ඒ බව පිළිගැනීමට අකමැති වෙති. ඔවුහු සාහිත්‍යයෙහි අධි යථාර්ථවාදය ආදී නම් පටබඳිමින් ලෝකය කෙසේ හෝ යථාර්ථවාදී නිව්ටෝනීය සුසමාදර්ශයෙහි කොටුකර තබාගැනීමට උත්සාහ කරති. ඒ හේතුවෙන් ඔවුන්ට ක්‍රිස්තියානි නූතනත්වයෙන් ගැලවීමක් ද නැත. මේ ගැලවීමට නොහැකි බව ඔවුන්ගේ ඊනියා පශ්චාත්නූතනවාදී සංකල්පවලින් ම පැහැදිලි වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva